# 44 - නැටුම් (දේශීය) II

1.

(i) ඇම්බැක්කේ 1

(ii) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ 1

(iii) මනිපුරි 1

(iv) පන්තේරු 1

(v) ආහාර්ය 1

(vi) කොහොඹාකංකාරි 1

(vii) විලම්භ 1

(viii) ඩබ්.බී. මකුලොලුව 1

(ix) (අ) කතකලි 1
     (ආ) මනිපුරි 1 } 2

(x) (අ) චිත්‍රසේන ඩයස් 1
    (ආ) එස්. පණීභාරත 1 } 2

(i) සිට (viii) දක්වා පිළිතුරකට ලකුණු 01 බැගින් - ලකුණු 08 යි

(ix) සිට (x) දක්වා පිළිතුරකට ලකුණු 02 බැගින් - ලකුණු 04 යි

2. (i) කුදංත ගත දොම් වට්ටම හෝ ගුඳගතිගත වට්ටම හෝ පට්වුතල් මාත්‍රයට ...
කරන්න.

**උඩරට නර්තන සම්ප්‍රදාය**

බෙර පදය - කුදංත ගත දොම්

| ∧ | | ∧ | | / | | | | ∧ | | ∧ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| + | + | + | + | කු | දිං | - | ත | ග | ත | දොම් | - | කු | දිං | - | ත |
| ග | ත | දොම් | - | | | | | | | | | | | | |

**පහතරට නර්තන සම්ප්‍රදාය**

බෙර පදය - ගුඳගතිගත

| / | | / | | / | | / | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
| ගු | ඳ | ග | ති | ග | ත | ගු | ඳ |
| ගු | ඳ | ග | ති | ග | ත | - | - |

**සබරගමු නර්තන සම්ප්‍රදාය**

දවුල් පදය - කුදත් තක්කිට තකට ජිමිතකු

| / | | | ∧ | | ∧ | | / | | | ∧ | | ∧ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 |
| කු | දත් | - | තක් | - | කි | ට | ත | ක | ට | ජි | මි | ත | කු |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02

බෙර පදය / දවුල් පදය ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

**ලකුණු 04**

(ii) "ත්‍රිවිධ ඥාන විදුරූ පඩි අපෙ මහ ගෞතම නම් මුනිඳු ඒ බුදු වූ" යන කවි පාදය, අදාළ තිත් රූපයට ප්‍රස්තාර කරන්න.

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| + | ත්‍රිවි | ධ | ඥා | - | න | - | විදු | රූ | - | - | පඩි | අ | පෙ | ම | හ |
| + | ගෞ | ත | ම | නම් | - | මු | නි | ඳු | - | - | ඒ | බු | දු | වූ | - |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02
කවි පාදය ප්‍රස්තාර කිරීමට - ලකුණු 02
**ලකුණු 04**

(iii) වෛරෝඩි වන්නමේ කස්තිරම හෝ ඊශ්වර කුණ්ඩ තාලයේ ඉරට්ටිය හෝ කදම්බපක්ෂි වන්නමේ කලාසම හෝ ප්‍රස්තාර කරන්න.

<u>**උඩරට වෛරෝඩි වන්නමේ කස්තිරම**</u>

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| රුඳු | ගත | ගත | ගත | කුකු | දත් | ගජිං | -ත | ගත් | ජිත් | කුන් | දත් |
| තකු | දග | ජිං | තකු | දග | ජිං | තකු | තක | තරි | කිට | කුඳු | කුඳු |
| ගජිං | -ත | ගත් | ජිත් | කුන් | දත් | තකු | තක | තරි | කිට | කුන් | දත් |
| තා | | | | | | | | | | | |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02
කස්තිරම ප්‍රස්තාර කිරීමට - ලකුණු 02
**ලකුණු 04**

**3.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(i) කෝලම් රඟමඩල

- එළිමහන් වටකුරු රඟමඩලක් බව
- කෝලම් රඟමඩල තානායම්පොළ නමින් හඳුන්වන බව
- එහි ප්‍රධාන සැරසිල්ල වෙස් අත්ත නමින් හඳුන්වන බව
- ගොරකා අතු, බුරුල්ල අතු, කෙසෙල් පතුරු, ගොප් කොළ.... වැනි අමුද්‍රව්‍ය භාවිත කරන බව
- පහන් පැලක්, ගායක හා වාදක කණ්ඩායම් රඟමඩල පසෙක සිටින බව
- ආලෝකය ලබා ගැනීම සඳහා කොප්පරා පහන් දල්වා ඇතිබව

**ඉහත කරුණුවලින් හතරක් වත් ලියා තිබේනම්**
**ලකුණු** 04

(ii) අංග රචනය

- නිර්මාණ කාර්යයේ දී ස්වභාවිකත්වය ඉක්මවා චරිත සඳහා වේශ නිරූපණය කිරීම අංග රචනය බව
- අංග රචනය රංග කාර්යයේ දී භාවිත වන බව
- වර්ණ සංකලනය සම්ප්‍රදායික හා නව නිර්මාණයන්ට අනුව අංග රචනය කර ගන්නා බව
- අංග රචනය කිරීමේ විධික්‍රම හඳුන්වා ඇති බව
- අංග රචනය සඳහා ද්‍රව්‍ය හා උපකරණ භාවිතයට ගන්නා බව

**ඉහත කරුණුවලින් හතරක් වත් ලියා තිබේනම්**
**ලකුණු** 04

(iii) ත්‍රිවිධ ලය

- තාලයේ වේගය ලය යනුවෙන් හඳුන්වන බව
- විලම්භ, මධ්‍ය, දෘත වශයෙන් ලය ත්‍රිවිධාකාර වන බව
- සමගුණ, දෙගුණ, සිව්ගුණ වශයෙන් ද හඳුන්වන බව
- ප්‍රස්තාර ගත කොට උදාහරණ ලෙස දක්වා තිබීම
- සරඹ අභ්‍යාසයේදී වැදගත් වන බව

**ඉහත කරුණුවලින් හතරක් වත් ලියා තිබේනම්**
**ලකුණු** 04

(iv) ටීකා සීපද

- ටීකා සීපද ගද්‍ය හා පද්‍ය කොටස් දෙකකින් සමන්විත වන බව (ආඝාතාත්මක හා අනාඝාතාත්මක)
- ටීකා කවි යනු ගැමි ගී අතර සුවිශේෂ ගායනා ක්‍රමයක් බව
- ගැමියන්, කාන්සිය, විඩාව දුරුකර ගැනීම සඳහා මෙම කවි ගායනා කරන බව
- කවිවලින් කිසියම් සිද්ධියක් පරිසරයක් විස්තර කෙරෙන බව
- හාස්‍ය, උපහාසය, ව්‍යාංගාර්ථ, අතිශෝක්තිය ... මතුවන බව
- උදාහරණ ලියා ඇත්නම්

**ඉහත කරුණුවලින් හතරක් වත් ලියා තිබේනම්**

(v) වේදිකා ප්‍රසංග

- ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක රංග කාර්යයක් ප්‍රසංග වේදිකාවට උචිත ආකාරයෙන් ඉදිරිපත් කිරීම බව
- ප්‍රේක්ෂකාගාරයක් ඉදිරිපස සිදුවන රසවින්දනාත්මක ඉදිරිපත් කිරීමක් බව
- විවිධ වේදිකා සඳහා ආලෝකකරණය , සැරසිලි, අංගරචනය, ඇඳුම් පැළඳුම් හා තාක්ෂණය යොදාගන්නා බව
- සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් නර්තන කලාව යොදා ගැනීමට අවස්ථාව සැලසෙන බව
- නව නිර්මාණ බිහිවීමට අවකාශය සැලසීම සහ ගීත අනුව නර්තනය වේදිකාවේ වඩාත් ජනප්‍රියත්වයට පත්වී ඇති බව

**ඉහත කරුණුවලින් හතරක් වත් ලියා තිබේනම්**

**ලකුණු 04**

**මෙයින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියා ඇත්නම් මුළු ලකුණු** (4 x 3) = 12

4. ත්‍රිවිධ නර්තන සම්ප්‍රදායයන් හා බැඳි ශාන්තිකර්මවල සංස්කෘතික පසුබිම අධ්‍යයනය කිරීමේ දී එකිනෙකට සමාන ලක්ෂණ පිළිබිඹු වේ.

(i) පහන් මඩුව පැවැත්වීමේ අරමුණු පිළිබඳ විස්තරයක් කරන්න.

- සේරමාන් රජුට ඇති වූ හිසරදය සුව කිරීම සඳහා අතීතයේ දී පැවැත් වූ බව
- වර්තමානයේ දී අම්මාවරුන්ගේ ලෙඩ රෝග ලෙස හැඳින්වෙන පැපොල, සරම්ප වැනි රෝග සුව කර ගැනීමට,
- ගමට රටට සෙත පතා ගව ධන ධාන්‍ය, භව භෝග, සම්පත් වැඩි දියුණු කර ගැනීමට,
- ස්වාභාවික විපත්වලින් ආරක්ෂා වීමට,
- අධ්‍යාපනික හා පර්යේෂණ අවශ්‍යතාවයක් ලෙස පවත්වන බව

**ඉහත කරුණුවලින් දෙකක් ලියා ඇත්නම්**

**ලකුණු 04**

(ii) දෙවොල් මඩුවේ භාවිත කරන කාන්තා රංග වස්ත්‍රාභරණ පිළිබඳ පැහැදිලි කරන්න.

- මෙහිදී පත්තිනි නර්තනය කාන්තා නර්තනයක් ලෙස ඉදිරිපත් කරන බව
- ස්ත්‍රී ලාලිත්‍ය දනවන ලෙස විචිත්‍රවත් ඇඳුම් කට්ටලයක් භාවිත කරන බව
- කහ සහ රතු වර්ණ භාවිත කරන බව
- පත්තිනි සළඹ හා සළුව අතැතිව නර්තනය කරන බව

**ඉහත කරුණුවලින් දෙකක් ලියා පැහැදිලි කර ඇත්නම් ලකුණු - 04**

(iii) කොහොඹා යක් කංකාරිය ශාන්තිකර්මයෙන් සමාජයට ලබාදෙන පණිවිඩය පිළිබඳ විමසීමක් කරන්න.

➢ පූර්ව චාරිත්‍රවිධි, ශාන්තිකර්ම දින චාරිත්‍ර වාරිත්‍ර, නාට්‍යමය පෙළපාලි, උපත් කතාව ඇසුරෙන් සමාජයට ලබා දෙන පණිවිඩය පහත කරුණු ඇසුරෙන් විස්තර කර ඇත්නම්
  - ➢ සාමුහිකත්වය
  - ➢ සමානාත්මතාවය
  - ➢ නායකත්වය
  - ➢ ආගන්තුක සත්කාර
  - ➢ සංස්කෘතිය පවරාදීම
  - ➢ වෛරය පළිගැනීම වැනි සාමාජ විරෝධි ක්‍රියාවලින් වැළකීම


**කරුණු දෙකක්වත් ඇසුරෙන් විමසීමක් කර ඇත්නම් ලකුණු 04**

**මුළු ලකුණු (4 x 3) = 12**


5. පහත දැක්වෙන රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C

(i) A රූපයෙන් දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කර, එහි භාවිත වේශ නිරූපණ ක්‍රම දෙකක් හඳුන්වන්න.

A රූපය - කතකලි නර්තන සම්ප්‍රදාය

මිනික්කු -
- ඔප දමන ලද යන අරුත දෙන බව
- සාමාන්‍ය වේශ නිරූපණ ක්‍රමයක් බව
- චරිත සඳහා රන් පැහැය යොදා ගන්නා බව
- කාන්තා චරිත සඳහා භාවිත කරන බව

පච්චා -
- පච්චා යනු කොළ වර්ණය බව
- ඉන්ද්‍ර, ක්‍රිෂ්ණ, රාම වැනි චරිත සඳහා යොදා ගන්නා බව

කත්ති -
- චක්‍ර පිහියක ආකාරයට අංග රචනය කරගන්නා බව
- රාවනා වැනි චරිත සඳහා යොදා ගන්නා බව

තාඩි -
- තාඩි යනු රැවුල් විශේෂයක් වන බව
- සුදු, රතු, කළු රැවුල් භාවිත වන බව

කාරි - • රාක්ෂ හා යක්ෂ වර්ගයේ කාන්තා චරිතවලට හා අතිශය බිහිසුනු චරිත සඳහා යොදා ගන්නා බව

• තද කළු වර්ණයෙන් යුක්ත වන බව

ඩෙප්පු - • නර්තන ශිල්පියා විසින් කරනු ලබන මූලික අංග රචනය වන බව

**නර්තන සම්ප්‍රදාය හා වේශ නිරූපණ ක්‍රම දෙක නම් කිරීමට** **ලකුණු 02**

**වේශ නිරූපණ ක්‍රම දෙක හැඳින්වීමට** **ලකුණු 02**

**ලකුණු 04**

(ii) B රූපයෙන් දැක්වෙන මුද්‍රා නාට්‍යය නම් කර, ඒ පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

B රූපය - කුඹි කතාව

- ප්‍රථම නිෂ්පාදනය
- පිටපත
- අංග රචනය
- රංග වස්ත්‍ර නිර්මාණය
- සංගීතය
- කතා පුවත ආදි කරුණු පිළිබඳ විස්තර කර ඇත්නම්

**මුද්‍රා නාට්‍ය නම් කිරීමට** **ලකුණු 01**

**කෙටියෙන් විස්තර කිරීමට** **ලකුණු 03**

**ලකුණු 04**

(iii) C රූපයට අදාළ ජන නාටකය නම් කර, එහි දැක්වෙන කාන්තා චරිතය පිළිබඳ විමසුමක් කරන්න.

C රූපය - සොකරි නාටකය

- ප්‍රධාන කාන්තා චරිතය බව
- රූමත් තරුණියක් වන ඇය ශෘංගාරාත්මක රසයක් මතුවන ආකාරයෙන් අංග චලන දක්වන බව
- සොකරි චරිතය බොහෝ විට දෑස්වලින් ඉඟිබිඟි පාමින් රංගනයේ යෙදෙන බව
- කවි ගායනය කරමින් "දොං ජිජි ගත" යන බෙර පද තාලයට රංගනයට ප්‍රවිෂ්ට වන බව

**ජන නාටකය නම් කිරීමට** **ලකුණු 01**

**කාන්තා චරිතය පිළිබඳ විමසුමක් කර ඇත්නම්** **ලකුණු 03**

**ලකුණු 04**

6. "21 වන සියවසේ දේශීය නර්තන කලාවේ ප්‍රවණතා, ආයතනික මෙන් ම වෘත්තීය මට්ටමින් ද ඉදිරියට ගමන් කොට ඇත." පහත දැක්වෙන කරුණු ඇසුරෙන් ඇගයීමක් කරන්න.

(i) අධ්‍යාපන ආයතන

- 2005 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලීය සෞන්දර්ය අධ්‍යයන ආයතනය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය නමින් ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පත් වීම.
- විශ්වවිද්‍යාලවල නර්තන විෂයය සම්බන්ධ උපාධි පාඨමාලා සංවර්ධනය වීම.
- ප්‍රාදේශීය මට්ටමින් සංස්කෘතික මධ්‍යස්ථාන, කලායතන බිහි වීම.
- ජාතික තරුණ සේවා සභාව, විවිධ ප්‍රදේශවල ව්‍යාප්ත වීම.
- ගුරු අධ්‍යාපන විද්‍යාපීඨයන්හි නර්තන පාඨමාලා ආරම්භ කිරීම.
- පාසැල්වල නර්තන විෂයය අඛණ්ඩ අධ්‍යාපන පාඨමාලා වශයෙන් පවත්වා ගෙන යාම.

**කරුණු දෙකක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 04**

(ii) වෘත්තීය ගමන් මග

- විවිධ නර්තන කණ්ඩායම් බිහි වීම. (මංගල උත්සව, විවිධ උත්සව, වේදිකා ප්‍රසංග)
- ත්‍රිවිධ හමුදා සහ පොලිස් නර්තන කණ්ඩායම් මගින් වෘත්තීය අවස්ථා බිහි වීම.
- රාජ්‍ය නර්තන කණ්ඩායම මගින් වෘත්තීය අවස්ථා බිහි වීම.
- පෞද්ගලික නර්තන කණ්ඩායම් බිහි වීම.
- අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ආයතන මගින් වෘත්තිකයන් බිහි වීම.
- සෞන්දර්ය විෂය ප්‍රවර්ධනය සඳහා සංස්කෘතික නිලධාරීන් පත් කිරීම.

**කරුණු දෙකක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 04**

(iii) සන්නිවේදනය

- රූපවාහිනිය මඟින් ශාන්තිකර්ම වැඩ සටහන්, සාකච්ඡා මණ්ඩප, වාර්තා වැඩ සටහන්, රියැලිටි වැඩ සටහන් විකාශය වන බව.
- අන්තර්ජාලයේ යූ-ටියුබ් ගිණුම් ආරම්භ කර හා එහි ටික්-ටොක් වැනි සන්නිවේදන ක්‍රම භාවිත කරන බව.
- අන්තර්ජාලය මඟින් ලෝකයේ ඕනෑම රටක නර්තන නැරඹීම හා එම නර්තන සංයෝග කර නව නිර්මාණකරණයට යොමු වීමට හැකි වන බව (Whatsapp/Viber/Facebook/Instergram)

**කරුණු දෙකක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 04**

**මුළු ලකුණු (4 x 3) = 12**

7. ශ්‍රී ලාංකේය වාද්‍ය භාණ්ඩ, විවිධ වූ සන්නිවේදන කාර්යභාරයන්ට යොදාගත් බව ඓතිහාසික තොරතුරු මගින් ගම්‍ය වේ.

(i) ආගමික වත්පිළිවෙත්හි වාදන අවස්ථා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

- හේවිසි වාදනය, මඟුල් බෙර වාදනය
  (ස්ථූප පූජා, බෝධි පූජා, දළදා පූජා වැනි ආගමික වත්පිළිවෙත් සඳහා වාදන යොදා ගත් බව)
- අලුයම් දුරය, මැදියම් දුරය, හැන්දෑ දුරය වැනි වාදන අවස්ථා ඇසුරෙන් විස්තර කර තිබේ නම්,
- වාදන අවස්ථා සඳහා භාවිත කරන වාද්‍ය භාණ්ඩ නම් කර තිබේ නම්,
- දළදා මාළිගාවේ වාදනය කෙරෙන විශේෂිත වාදන ක්‍රම හඳුන්වා තිබේ නම් (අඹරා හේවිසි, ගෙවැදුම් හේවිසි ආදි)

**කරුණු දෙකක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 04**

(ii) රාජ්‍ය පාලකයන්ගේ කාර්යභාරයන් සඳහා වාදනය යොදාගත් ආකාරය සාකච්ඡා කරන්න.

- අණ බෙර වාදනය
- රණ බෙර වාදනය
- වද බෙර වාදනය
- මළ බෙර වාදනය

**රාජ්‍ය පාලකයාගේ කාර්ය භාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කර ඇත්නම් ලකුණු 04**

(iii) වර්තමානයේ සමාජ උත්සව සඳහා වාද්‍ය සන්නිවේදන කාර්යභාරය විමසුමට ලක් කරන්න.

- මඟුල් බෙර වාදනය
- බංකු රබන් වාදනය
- නර්තන හා තූර්ය වාදක කණ්ඩායම්
- හේවිසි වාදනය
- මළ බෙර වාදනය

**ඉහත කරුණු දෙකක් ඇසුරින් සන්නිවේදන කාර්ය භාරය විමසුමට ලක් කර ඇත්නම් ලකුණු 04**

**මුළු ලකුණු** (4 x 3) = 12